# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1175/13 – 2001 මාර්තු 15 වැනි බ්‍රහස්පතින්දා – 2001.03.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
සෞඛ්‍ය අමාත්‍ය.

2001 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ.

නියෝග

1. මෙම නියෝග ආහාර (තිරිඟු පිටි සඳහා පොටැසියම් බ්‍රෝමේට් තහනම් කිරීම) යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙය ප්‍රකාශයට පත්වන දින සිට ක්‍රියාත්මක වනු ලැබේ.

2. කිසිදු තැනැත්තෙකු විසින් තිරිඟු පිටිවලට යෙදීම සඳහා පොටැසියම් බ්‍රෝමේට් ආනයනය, විකිණීම හෝ ගබඩා කිරීම නොකළ යුතුය.

3. කිසිදු තැනැත්තෙකු විසින් පොටැසියම් බ්‍රෝමේට් එකතු කරන ලද හෝ ප්‍රතිකාරකයක් වශයෙන් භාවිතා කළ තිරිඟු පිටි ආනයනය, ප්‍රවාහනය, ගබඩා කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

4. කිසිදු තැනැත්තෙකු විසින් පොටැසියම් බ්‍රෝමේට් එකතු කරන ලද හෝ ප්‍රතිකාරකයක් ලෙස භාවිතා කළ තිරිඟු පිටි සංඝටකයක් ලෙස අඩංගු කොට සෑදූ ආහාර ආනයනය, ප්‍රවාහනය, ගබඩා කිරීම, නිෂ්පාදනය, විකිණීම හෝ විකිණීමට ප්‍රදර්ශනය කිරීම නොකළ යුතුය.

03-846


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - H 010946-3,000 (2001/03)